ගැත්තා රෝගාතුර වූ විටෙක හෝ ගමනක නිරත වූ විටෙක, ඔහු නිරෝගීව හා පදිංචිව සිටිය දී සිදු කරමින් ආ ක්රියාවන්ට සමාන දෙයක් ඔහුට නියම කරනු ලැබේ

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ මූසා අල්-අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "ගැත්තා රෝගාතුර වූ විටෙක
හෝ ගමනක නිරත වූ විටෙක, ඔහු නිරෝගීව හා පදිංචිව සිටිය දී සිදු කරමින් ආ
ක්රියාවන්ට සමාන දෙයක් ඔහුට නියම කරනු ලැබේ." [صحيح] [رواه البخاري]

අල්ලාහ්ගේ මහිමය හා ඔහුගේ කරුණාව පිළිබඳ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියි. සැබැවින්ම මුස්ලිම්වරයකුගේ පුරුද්දක් ලෙස තමන් නිරෝගීව හා පදිංචිව සිටිය දී කරමින් ආ දැහැමි ක්රියාවන් වී නම්, පසුව ඔහු යම් හේතුවත් මත රෝගී තත්ත්වයට පත්ව එය ඉටු කිරීමට නොහැකි වූ විටෙක හෝ එය ඉටු කිරීමට නොහැකිව ගමනක නිරත වූ විටෙක, එය කවර හෝ බාධකයක් වුව ද ඔහු නිරෝගී තත්ත්වයේ හා පදිංචි ව සිටිය දී සිදු කරමින් ආ ක්රියාවන්ට සමාන පූර්ණ ප්රතිඵල ඔහුට ලියනු ලැබේ.

http://sunnah.global/hadeeth/si/show/3553